			දේශීය	විදේශීය		
ITMIS පරිගණක වැඩසටහන පිළිබඳ නිලධාරීන් පුහුණු කිරීම	55	දින 04	87,800.00	-	දේශීය	උක්ත පුහුණු වැඩසටහන් වලට අදාලව නිලධාරීන් ගේ දැනුම ආකල්ප වර්ධනය හා කාර්යක්ෂම සඵලදායී සේවාවක් සපයාගත හැකි වීම
ග්‍රාම නිලධාරීන් වෙත Google Earth Pro මෘදුකාංගය පිළිබඳ පුහුණුව ලබා දීම	249	දින 01	84,000.00	-	දේශීය	
ග්‍රාම නිලධාරීන් වෙත ඉඩම් රාජකාරී පිළිබඳ පුහුණුව ලබා දීම	249	දින 07	166,036.00	-	දේශීය	
ග්‍රාම නිලධාරී පුහුණු වැඩසටහන	249	දින 02	239,350.00	-	දේශීය	

ආයතනයේ කාර්ය සාධනය උදෙසා පුහුණු වැඩසටහන දායක වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් පැහැදිලි කරන්න.

- 2022 ජනවාරි මස සිට ITMIS පරිගණක පද්ධතිය මගින් ගිණුම් තැබීමේ ක්‍රියාවලිය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය දැනුම සියලුම මාණ්ඩලික නිලධාරීන් ඇතුළු ගිණුම් කටයුතු සිදුකරන නිලධාරීන් වෙත ලැබීම මගින් කාර්යක්ෂමව රාජකාරී ඉටු කිරීමට හැකි වීම.
- ග්‍රාම නිලධාරීන් වෙත ඉඩම් රාජකාරී හා මෘදුකාංගය පිළිබඳව පුහුණුව ලැබීම මගින් සේවාලාභීන් වෙත ඉඩම් ගැටලු නිරාකරණය නිවැරැදිව හා ඵලදායීව සිදුකළ හැකි වීම.

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කර තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නොවේ.		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම	අදාල නොවේ		
1.6	වෙනත්	අදාල නොවේ		
2	**පොත්පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ.445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන/ පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.5	සියලුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙළ කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
3	**මූල්‍ය පාලනය සඳහා කාර්යන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)**			
3.1	මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.2	මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිළධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරීවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට, සියලුම විගණන විමසුම්වලට පිළිතුරු ලබා දී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ.134(2) DMA/1-2019 අනුව, වසර ආරම්භයේ දී විගණකාධිපතිවරයා සමග සාකච්ඡා කිරීමෙන් අනතුරු ව, අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළ දී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව , සියලුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණය චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිලදී ගැනීම් හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 01/2020 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයක දී අපහරණය කර තිබීම	අනුකූල නොවේ	අමාත්‍යාංශ අනුමැතිය ලද පසු අපහරණය කරනු ලැබේ.	අමාත්‍යාංශ අනුමැතිය ඉක්මනින් ලබා ගැනීම
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103, 104, 109 හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව,වාහනවල ඉන්ධන දහනය වීම් නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාලසීමාවෙන් අනතුරු ව, බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙළ කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
10.2	සමාලෝචිත වර්ෂයේ දී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශවලින් අනාවරණය වූ හා ගැළපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට ඵලඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්වලට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිගහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිගහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	ණය ශේෂ සම්බන්ධයෙන් ඉදිරි ක්‍රියාමාර්ග අවසන් වී නොතිබීම	ඉදිරි ක්‍රියාමාර්ග අවසන් වූ පසු ඒ අනුව කටයුතු කිරීම
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේ දී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්යය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසිවලට අනුකූලව, රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කොට තිබූ ආදායම්, තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ.176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියලුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියලුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පල කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්ත්වය (අනුකූල වේ/අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			
19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිළධාරියෙකු පත් කොට තිබීම	අනුකූල වේ		
20	**විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම**			
20.1	ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වා දී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම	අනුකූල වේ		

අවසානයි.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. POL/B/DS/09/FS/2021 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 මැයි 31 දින

දිස්ත්‍රික් ලේකම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, පොළොන්නරුව.

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණන්දීමේ නිලධාරී වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 මැයි 30 දින නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පොළොන්නරුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කළ සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

1.6. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරණ රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.1 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ යුතු SA71, SA81 හා SA90 ආකෘති මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කර නොතිබුණි.

1.6.2. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

---

i වී මිලදී ගැනීමේදී සිදුවූ අලාභය කපා හැරීම සඳහා අත්තිකාරම් ලෙස ලැබී තිබූ රු.13,787,542 ක මුදල මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ලැබීම් ලෙස වෙනම අනාවරණය නොකර, රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුමේ ලැබීම් වටිනාකමට එකතු කර දක්වා තිබුණි.

ii. ඉහත අලාභය කපා හැරීමේදී සිදු කරන ලද අත්තිකාරම් පියවීම මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ අත්තිකාරම් ගෙවීම් ලෙස අනාවරණය නොකර වෙනත් පුනරාවර්තන වියදම් ලෙස නිරූපණය කර තිබුණි.

1.6.3. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

මූල්‍ය වත්කම්

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ අත්තිකාරම් ගිණුම් ශේෂය ලෙස රු. 107,489,611 ක් දැක්විය යුතු වුවද, එම වටිනාකම රු. 93,702,069 ක් ලෙස අනාවරණය කර තිබීමෙන් ශුද්ධ වත්කම් 13,787,542 ක් වැඩියෙන් දැක්වුණි.

02. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පරිපූරක ඇස්තමේන්තු සම්මත කරගත යුත්තේ අත්‍යාවශ්‍ය හදිසි වියදම් සඳහා පමණක් වන නමුත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ වැය ශීර්ෂ 3 ක් වෙනුවෙන් රු. 367,000,000 ක ප්‍රතිපාදන, පරිපූරක ඇස්තමේන්තු යටතේ සම්මත කර ගෙන තිබූ අතර, එම ප්‍රතිපාදන වල ඉතිරිය සියයට 14 ත් සියයට 88 ත් අතර ප්‍රමාණයක් වී තිබුණි.

2.2 බැරකම් බැඳීම් වලට එළැඹීම

---

i. 2017 අප්‍රේල් 27 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 255/2017 (අ) ප්‍රකාරව සේවාවන් ලබාගත් පසු ඒ සඳහා ගෙවීමට ඇති මුදල බැරකම් ලෙස හඳුනාගත යුතු වුවත්, සැපයුම් හා සේවාවන් සම්බන්ධයෙන් ගෙවිය යුතු රු. 727,416 ක මුදල මූල්‍ය ප්‍රකාශන වල බැරකම් ලෙස හඳුනාගෙන නොතිබුණි.

ii. උක්ත චක්‍රලේඛයේ 2(අ) වගන්තියෙහි දක්වා ඇති පරිදි පුද්ගල පඩි නඩි හැර අනෙකුත් ගෙවීම් සඳහා වර්ෂික අයවැය සීමාව තුල ප්‍රථමයෙන් බැඳීම් හඳුනාගත යුතු වුවද දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පවිත්‍රතා හා සනීපාරක්ෂක සේවාව සපයා ගැනීම සඳහා අදාළ සැපයුම්කරු සමඟ ඇතිකරගත් ගිවිසුම ප්‍රකාරව 2022 ජනවාරි සිට මැයි 31 දක්වා කාලච්ඡේදය සඳහා රු.3,508,875 ක් වූ බැඳීම් හඳුනාගෙන ඉහත කී බැඳීම් හා බැරකම් ප්‍රකාශය තුල අනාවරණය කර නොතිබුණි.

2.3 වෙනත් අමාත්‍යාංශ දෙපාර්මේන්තු විසින් ලබාදුන් ප්‍රතිපාදන උපයෝජනය

(i) ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය මඟින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කරන ලද පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ආපදා අවම කිරීමේ ව්‍යාපෘතිය යටතේ රු.3,385,751 ක් වැයකර හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ඉදිකර තිබූ එල්බී 04 පාලම ප්‍රතිසංස්කරණය හා කුඩා වරාතේන පාලම ප්‍රතිසංස්කරණය යටතේ පාලම් දෙපස පස් පුරවා කැනීම් සිදුකර නොමැති නිසා ව්‍යාපෘතියෙන් අපේක්ෂිත අරමුණු ඉටු වී නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ සැප්තැම්බර් 30 වන විට පොළොන්නරුව දිස්ත්‍රික්කය තුල ක්‍රියාත්මක ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියරේ හා දෙවන අදියරේ පිළිවෙලින් සමිති 11 ක් හා සමිති 45 ක් අක්‍රීය බව හඳුනාගෙන තිබූ අතර එම සමිති සඳහා අදියර දෙකෙහිදීම යටිතල පහසුකම් සංවර්ධන, ධාරිතා සංවර්ධන හා ජීවනෝපාය සංවර්ධන අරමුදල් සඳහා ලබාදී තිබූ එකතුව 14,685,474 ක් බැංකු ගිණුම් වල නිෂ්කාර්යව පැවතුණි.

(iii) ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරයේ පළමු අදියරේ හා දෙවන අදියරේ සක්‍රීය සමිති සඳහා ලබාදුන් පිළිවෙලින් රු. 4,578,358 හා රු.704,347 ක් බැංකු ගිණුම් වල නිශ්කාර්යව පැවතුනි.

2.4 ප්‍රධාන ගණන්දීමේ නිලධාරි/ ගණන්දීමේ නිලධාරි විසින් සිදුකළ යුතු සහතිකවීම්

(i) විගණකාධිපති වාර්තාව අවශ්‍ය වන පරිදි නිශ්චිත කාලසීමාවක් තුළ සියළුම විගණන විමසුම් වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.6 ඡේදය ප්‍රකාරව විගණන විමසුම් වලට පිළිතුරු ලබාදී නොතිබුණි.

(ii) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායී ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත්, වාර්තාවේ 3.4 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි.

2.5 නීති, රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

නීති රීති රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව	වටිනාකම	අනුකූල නොවීම
	රු.	
(අ) පනත්		
1958 අංක 29 හා 1964 අංක 20 දරන සතුන් සාතනය කිරීමේ පනත	-	එක් දිනක් තුල සතුන් ප්‍රවාහනය කළ යුතු වුවත්, තමන්කඩුව, වැලිකන්ද හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ගවයන් ප්‍රවාහනය කිරීම සඳහා දින කිහිපයක් ලැබෙන පරිදි බලපත්‍ර නිකුත් කර තිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය		
(i) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද	225,075	සේවය හැරගොස් ඇති නිලධාරීන් දෙනෙකුගෙන් අයවීමට ඇති එකතුව රු.225,075 ක් වූ ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ii) ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.5 හා 4.6 ඡේද	753,509	මිය ගිය නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවීමට ඇති එකතුව රු.753,509 ක ණය ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(iii)	ආයතන සංග්‍රහයේ XXIV පරිච්ඡේදයේ 4.6 ඡේදය	408,048	වැඩතහනමට ලක්වී ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.408,048 ක ණය ශේෂයක් වර්ෂ 10 කට අධික කාලයක් ගතවී ඇතත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.
(ඇ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය ----------		
	මු.රෙ. 396(ඇ)	1,183,346	2019 ජූනි 26 දින සිට 2021 ජූලි 30 දක්වා කාලය ඉකුත් වූ රු.1,183,346 ක් වටිනා වෙක්පත් 63 ක් පොදු තැන්පතු ගිණුමට බැර කර බැංකු සැසඳුම් නිරවුල් කර තිබුණි.
(ඇ)	වෙනත් චක්‍රලේඛ ---------- 2014 ජනවාරි 03 දිනැති දිවි නැගුම ප්‍රජාමූල බැංකු වැඩසටහන මැයෙන් නිකුත් කළ චක්‍රලේඛයේ 8.5 ඡේදය		වැලිකන්ද හා දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාල වල, රු.250,001 සිට 1,000,000 දක්වා සීමාව තුල නිකුත් කරනු ලබන ණය සඳහා වංචල / නිශ්චල දේපලක් ඇපකර ලෙස තබා ගත යුතු අතර, එම වත්කම් සමෘද්ධි බැංකුව නමින් ලියාපදිංචි කළයුතු වුවත්, එලෙස ලියාපදිංචි කිරීමකින් තොරව අදාළ ලියකියවිලි ලබා ගෙන තිබීමෙන් ණය පැහැර හැරීමකදී අදාළ වත්කම් බැංකුව නමින් අත්පත් කර ගැනීමට නොහැකි වී තිබුණි.

2.6 අවිධිමත් ගනුදෙනු

අංක 2014/7 දරණ දිවි නැගුම සංවර්ධන දෙපාර්තමේන්තුවේ, අධ්‍යක්ෂ ජනරාල්ගේ දිවි නැගුම චක්‍රලේඛයෙහි 6 වගන්තියේ උපදෙස් ප්‍රකාරව නිවාස ණය (ගෘහ ඒකක ණය) ලබා දිය හැකි උපරිම සීමාව රු. 300,000 ක් ලෙස දක්වා ඇතත්, කළමනාකරණයේ අභිමතය මත 2017 හා 2018 වර්ෂවලදී පුද්ගලයන් එකොලොස් දෙනෙකු වෙත රු.500,000 බැගින් ගෘහ ඒකක ණය 5,500,000 නිකුත් කර තිබුණි. ඒ අනුව එම ණය වලින් 2019.12.31 දිනට අයකර ගත යුතු එකතුව රු.3,385,327 ක් සමාලෝචිත වර්ෂයේ අවසාන වන විට බොල් ණය ලෙස වෙන් කර තිබුණි.

2.7 බැංකු ගිණුම් මෙහෙයවීම

පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි බැංකු සංගම් 22 ට අදාළව 2021 ජූනි 30 දිනට ක්‍රීය බැංකු ගිණුම් 19,437 ක එකතු වටිනාකම රු.61,967,268 ක් පැවතුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 සැලසුම් කිරීම

තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක කිරීමට යෝජනා කර තිබූ ව්‍යාපෘති 08 ක් වෙනුවට වෙනත් ව්‍යාපෘති 07 ක් ඉටු කර තිබුණි.ඒ අනුව ක්‍රියාකාරී සැලැස්ම නිසිපරිදි සංශෝධනය සිදුකර නොතිබුණි.

3.1.2 කාර්යයන් ඉටුනොකිරීම

මැදිරිගිරිය ප්‍රදේශීය ලේකම් කාර්යාලය වෙත 2021 සාම්ප්‍රදායික ග්‍රාමීය කර්මාන්ත ගම්මාන සංවර්ධන ඒකාබද්ධ වැඩසටහන යටතේ රු.1,822,064 ක මුදලක් අනුමත වී තිබුණද, එක් පුහුණු වැඩසටහනක් පැවැත්වීමට අමතරව, රු.23,100 ක මෙවලම් ලබාදීම පමණක් සිදුකර තිබුණි.

3.1.3. ප්‍රධාන කාර්යන්ට පටහැනි ක්‍රියාකාරකම්

කොවිඩ් 19 ව්‍යසනකාරී තත්ත්වය හේතුවෙන් බලපෑමට ලක්වූ පවුල් සඳහා රු.5,000 ක දීමනාවක් අග්‍රාමාත්‍ය අතිරේක ලේකම්ගේ අංක PTF/03/2021 හා 2021 අප්‍රේල් 10 දිනැති චක්‍රලේඛය ප්‍රකාරව 2021 අප්‍රේල් සහ ජූනි මාසවල අවස්ථා දෙකකදී ගෙවීම් කර තිබුණි. එහිදී සමෘද්ධිලාභීන් සඳහා අදාළ දීමනාව ලබාදීමේදී මාසිකව රු.22,000 ක පුහුණු දීමනාවක් ලබමින් සිටින බහුකාර්යය සංවර්ධන සහායක පුහුණු ලාභීන් සඳහාද රු.5,000 ක එම දීමනාව ලබාදීමට කටයුතු කර තිබීම හේතුවෙන් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ බැංකු සංගම් 19 කට අදාළ පවුල් 421 ක් සඳහා රු. 4,190,000 ක් ගෙවීම් කර තිබුණි.

3.1.4 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

(i) හිඟුරක්ගොඩ හා ඇළහැර විදුලි වැට ආශ්‍රිත මුර කුටි 28 ක් ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව සියළු බදු රහිතව රු. 22,949,234 ක මුදලකට කොන්ත්‍රාත් ආයතනයක් වෙත පවරා තිබූ අතර 2021 ඔක්තෝබර් 20 දින වැඩ නිම කළ යුතු නමුත් 2022 පෙබරවාරි 25 දින වන විටත් එහි එක් එක් ප්‍රමාණ පත්‍රයන්යන්හි අයිතම 29 ක් යටතේ දක්වා තිබූ රු. 13,552,179 ක් වටිනා වැඩ කොටස් කොන්ත්‍රාත්කරු විසින් ඉටු නොකර අතහැර දමා තිබුණි. මෙම ඉදිකිරීම් කාර්යයන් අවසන් නොකර මෙසේ තිබීමට ඉඩ හැරීමෙන් රජය විසින් මේ වන තෙක් වැය කර තිබූ රු. 6,556,819 ක් නිෂ්කාර්ය වී තිබුණි.

(ii) ඉහත ව්‍යාපෘති වෙනුවෙන් කොන්ත්‍රාත්කරු වෙත රු.2,074,645 ක අධි ගෙවීමක් සිදු කර ඇති නමුත් කාර්යසාධන සුරක්ෂණ 2021 නොවැම්බර් 07 දින අවලංගු වීමෙන් පසුව, නැවත කාලය දීර්ඝ කිරීම සිදු කර නොතිබීමෙන් කොන්ත්‍රාත්කරු කොන්ත්‍රාත්කාර්යය පැහැර හැරීම නිසා රජයට සිදු වූ පාඩුව අවම කර ගැනීමට ද හැකියාව ලැබී නොතිබුණි.

(iii). හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාමීය මාර්ග සංවර්ධන වැඩසටහන යටතේ රු.6,848,004 ක වටිනාකමකට ගිවිසුම් ගත වී තිබුණු සංවර්ධන ව්‍යාපෘති 06 ක් විගණිත දිනය වූ 2022 මාර්තු 10 වන විටත් ක්‍රියාත්මක නොකර අත්හැර දමා තිබුණි.

3.1.5 ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදය

(i). දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ක්‍රියාත්මක කරන ලද දිඹුලාගල අලිවැට ආශ්‍රිත මුරකුටි 13 ක් ඉදි කිරීමේ ව්‍යාපෘතියෙහි කොන්ත්‍රාත් කාලය දීර්ඝ කර ගැනීමෙන් පසු 2022 ජනවාරි 30 දින වැඩ අවසන් විය යුතු වුවත් එහි එක් එක් ප්‍රමාණ පත්‍රයන්හි අයිතම් 8 ක් යටතේ දක්වා තිබූ රු. 3,422,064 ක් වටිනා වැඩ කොටස් 2022 පෙබරවාරි 28 දින වන විටත් ඉටුකර නොතිබුණි.

(ii) ගම සමඟ පිළිසඳර වැඩසටහන 2021 මඟින් ඉදිකිරීම් ආරම්භ කරන ලද වෙඩිකවිවිය ප්‍රදේශයේ ක්‍රීඩා පිටි 02 ක් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතියේ ගිවිසුම් ප්‍රකාරව 2021 දෙසැම්බර් 25 දින වැඩ නිම කළ යුතු වුවත්, එම වැඩ නිමකර නොතිබියදී තාක්ෂණික නිලධාරි විසින් සාවද්‍ය ලෙස වැඩ නිමකළ බවට නිර්දේශ කිරීම මත අවසන් බිල්පත සඳහා රු.4,486,004 ක් ගෙවීම් කර තිබුණි. එසේම 2022 මාර්තු 08 දින වන විටත් වැඩ නිම කළ යුතු දිනය ඉක්මවා දින 72 ක් ගතවී ඇතත් ඒ සඳහා අයවිය යුතු රු.80,748 ක ප්‍රමාද ගාස්තු අඩුකර ගැනීමටද මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් කටයුතු කර නොතිබුණි.

3.2 ප්‍රසම්පාදනය

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව හා ප්‍රසම්පාදන අත්පොතෙහි 4.2.1 ඡේදයෙහි දක්වා ඇති ආකෘතිය ප්‍රකාරව තමන්කඩුව සහ ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

(i) වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාවිතා කරනු ලැබූ වාහන 04 ක් අලුත්වැඩියා කර භාවිතයට ගැනීමට හෝ භාවිතයට ගැනීමට නොහැකි නම් අපහරණය කිරීමට හෝ කටයුතු නොකර වසර 02 සිට 05 කට අධික කාලයක සිට නිෂ්කාර්යව පැවතුණි.

(ii) පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය මඟින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබාදී රු.1,450,194 ක් වටිනා ඉංජිනේරු ද්‍රව්‍ය ඉන්වෙන්ට්‍රිගත කර නොතිබුණු අතර, එම භාණ්ඩ නිෂ්කාර්යව දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ගබඩා කර තිබුණි.

(iii) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලය වෙත නිවාස සංවර්ධන අධිකාරිය විසින් කුලී සින්න පදනම මත ලබා දී ඇති නිල නිවාස 08 ක් වෙනුවෙන් ගිවිසුම් ප්‍රකාරව මාසිකව ගෙවිය යුතු නිවාස කුලිය රු.3,525 ක් වුවත්, එම නිවාස 08 සඳහා මාසික කුලී වශයෙන් අයකරනු ලබන රු.28,912 ක මුළු මුදලම නිවාස සංවර්ධන අධිකාරිය වෙත යැවීමට කටයුතු කර තිබීමෙන්, මාසික කුලිය ඉක්මවා නිවාස සංවර්ධන අධිකාරියට යවන ලද මුළු මුදල කොපමණද යන්න හඳුනාගැනීමට අදාළ ලේඛන දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් නඩත්තු කර නොතිබුණි.

(iv) 1983 වර්ෂයේ සිට 2021 ජුනි දක්වා කාලය තුල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය විසින් කුලී, සින්න පදනම මත දිස්ත්‍රික් ලේකම් වෙත ලබාදී ඇති නිවාස වෙනුවෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත ගෙවීම් කර ඇති නිවාස කුලී ප්‍රමාණය හා තවදුරටත් ගෙවිය යුතු කුලී මුදල් ප්‍රමාණය අනුව 2021 ජුනි වන විට තක්සේරු වටිනාකම ඉක්මවා නිවාස 07 ක් සඳහා රු. 215,226 ක් නිවාස කුලී වශයෙන් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත මුදල් ගෙවා තිබූ නමුත් තක්සේරු වටිනාකම ගෙවා අවසන් වී ඇති නිවාස වල අයිතිය දිස්ත්‍රික් ලේකම් වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබූ අතර කඩා ඉවත් කළ අංක 6 දරණ නිවස වෙනුවෙන් රු. 69,998 ක මුදල අයකර ගැනීමට කටයුතු කර ද නොතිබුණි.

3.4 මූල්‍ය අක්‍රමිකතා ස්වරූපයේ ගනුදෙනු

(i) ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ සමෘද්ධි නිලධාරීන් පස් දෙනෙකු විසින් ආයතන සංග්‍රහයේ පළමුවන උපලේඛනයට ඇතුලත් වන රු.2,410,617 ක මූල්‍ය වංචා සිදුකර ඇති බවට අනාවරණය කරගෙන තිබූ අතර, තවදුරටත් අදාළ නිලධාරීන්ගෙන් අයවිය යුතු හිඟ මුදල රු. 652,167 ක් වී තිබියදී ඔවුන් දෙවන උපලේඛනයට ගැනෙන වරදක් සිදුකර ඇති බවට සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ ජනරාල් විසින් නිගමනය කර තිබුණි.

(ii) දිඹුලාගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ 2018 ජුනි 11 දින සිට 2021 මැයි දක්වා කාලය තුළ වැඩිහිටි දීමනා හා වකුගඩු දීමනා ගෙවීම් කිරීමේදී සිදුවී තිබූ රු.2,443,600 ක මූල්‍ය අක්‍රමිකතාවය අදාළ නිලධාරියාගෙන් අයකර තිබුණද, ආයතන සංග්‍රහයේ II වැනි කාණ්ඩයේ XLVIII වැනි පරිච්ඡේදයේ පළමු උපලේඛනය යටතේ වන වරදක් බව අනාවරණය වුවද, එම නිලධාරියා සම්බන්ධයෙන් කිසිදු විධිමත් විනය පරීක්ෂණයක් සිදුකර නොතිබුණි.

3.5 පාඩු හා හානි

(i) 2019 වර්ෂයේ ක්‍රියාත්මක කර ඇති සුළු හා මධ්‍ය පරිමාණ මෝල්හිමියන් නගා සිටුවීමේ වැඩසටහන යටතේ පොළොන්නරුව සහල් නිෂ්පාදකයින්ගේ සමූපකාර සමිතිය වෙත ලබාදෙන ලද රු.මි. 206 ක මුදලින් තවදුරටත් අයවිය යුතු රු.මි.65.6 ක මුදල අයනොවීම සම්බන්ධයෙන්, 2020 අගෝස්තු 24 දින මූල්‍ය අපරාධ විමර්ශන ඒකකය වෙත දන්වා තිබුණද, විගණිත දින වන විටත් එම මුදල අයකර ගෙන නොතිබුණි.

(ii) 2009 මැයි 06 දිනැති අංක 1600/18 හා 2021 පෙබරවාරි 25 දිනැති අංක 2216/34 දරණ අතිවිශේෂ ගැසට් පත්‍රය මඟින් රජයේ ඉඩම්වල බණිජ ද්‍රව්‍ය එකතු කිරීමේ ගාස්තු වශයෙන් 2017 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලයට අදාළව අයවිය යුතු රු. 142,191,147 ක මුදලක් පොළොන්නරුව දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 05 ක පවත්වාගෙන ගිය බලපත්‍රලාභී කළුගල් වැඩපොළවල් 43 කින් අයකරගෙන නොතිබුණි.

(iii) 2019 ගම්පෙරළිය කඩිනම් සංවර්ධන වැඩසටහන හා පිබිදෙමු පොළොන්නරුව දිස්ත්‍රික් සංවර්ධන වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් වෙත ලබාදීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මඟින් මිලදීගෙන ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලබාදී තිබූ සෙවිලි තහඩු වලින් පළුදු වූ සෙවිලි තහඩු 864 ක් මිළදීගෙන වසර 3 කට අධික කාලයක් ගත වී ඇතත්, රජයට සිදුවූ අලාභය පියවා ගැනීමට කටයුතු කර නොතිබුණි. එම සෙවිලි තහඩුවල වර්තමාන වෙළඳපල වටිනාකම (බදු රහිතව) රු. 3,554,345 ක් විය.

(iv) හිඟුරක්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් භාවිතා කර තිබූ 53-7324 අංක දරන රථයට 2005 පෙබරවාරි 09 දින සිදු වූ අනතුරින් වූ රු.250,000 ක අලාභය සඳහා අනතුර සිදුකළ පාර්ශවයේ තෙවන පාර්ශව රක්ෂණාවරණය මඟින් රු.100,000 ක මුදලක් ලබා දීමට එකඟ වී තිබුණද නියමිත කාලය තුළ එම මුදල ලබා ගැනීම සඳහා කටයුතු නොකිරීම හේතුවෙන් රක්ෂණ සමාගමෙන් මෙම මුදලද අයකර ගැනීමට නොහැකි වී තිබුණි.

3.6 විගණන විමසුම් වලට පිළිතුරු ලබානොදීම

සමාලෝචිත වර්ෂයට අදාළව දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලද විගණන විමසුම් 07 ක් සඳහා 2021 මැයි 18 දින වන විටත් පිළිතුරු ලබා දී නොතිබුණි.

විගණන විමසුම් අංකය	විගණන විමසුම නිකුත් කළ දිනය
NCP/L/A/DSPL/2021/110/AQ/02	2021.09.15
POL/B/DSMG/2021/153/AQ/12	2022.01.24
POL/B/DSTK/2021/06/AQ/15(I)	2022.03.21
POL/B/DSTK/2021/06/AQ/15(II)	2022.03.21
POL/B/DSHG/21/14/AQ/16	2022.03.31
POL/B/DSPL/2021/19/AQ/18	2022.04.19
POL/B/DSPL/2021/19/AQ/19	2022.04.20

3.7 කළමනාකරණ දුර්වලතා

3.7.1 සුළු පරිමාණ වී මෝල් හිමියන් හරහා වී මිලදීගැනීමේ වැඩසටහන

ප්‍රාදේශීය ලේකම් කාර්යාල හරහා 2019/20 මහ, 2020 යල, 2020/21 මහ කන්න සඳහා වී ලබාගත් මෝල් හිමියන් 44 දෙනෙකු විසින් මිළදී ගන්නා ලද වී කිලෝ ග්‍රෑම් 1521337 ක් සහල් බවට පත්කර රජයට ලබානොදීම හේතුවෙන් තවදුරටත් රජයට අයවිය යුතු මුදල රු.85,181,090 ක් වී තිබුණි.

3.7.2 විශ්‍රාම වැටුප්

(i) 2010 සැප්තැම්බර් 07 දිනැති අංක 8/2010 හා 2014 ජනවාරි අංක 1/2014 දරණ විශ්‍රාම වැටුප් චක්‍රලේඛ ප්‍රකාරව ජීවන වියදම් දීමනාව සහිත රජයේ වැටුපක් ලබයිනම්, එම වැටුප් ලබන කාල සීමාවේ විශ්‍රාම වැටුපක්ද ලබයි නම්, විශ්‍රාම වැටුප සඳහා ජීවන වියදම් දීමනාව හිමි නොවේ. නමුත් ඊට පටහැනිව වයස අවුරුදු 55 දක්වා ශ්‍රී ලංකා යුද්ධ හමුදාව විසින් වැටුප් හා දීමනා ගෙවනු ලබන නිලධාරීන් හයදෙනෙකු සඳහා තමන්කඩුව හා ඇලැහර ප්‍රාදේශීය ලේකම් කාර්යාල මඟින් විශ්‍රාම වැටුප සමඟ ජීවන වියදම් දීමනාවද, ගෙවීම් කර තිබීම නිසා රු 1,225,242 ක අධි ගෙවීම් සිදුවී තිබුණි.

(ii) යළි විවාහ වන වැන්දඹුවකට විශ්‍රාම වැටුප් ගෙවීමේදී, වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුපෙන් සියයට 50 ක් ගෙවනු ලබයිනම්, එය විශ්‍රාම වැටුප සමඟ ගෙවන සියළු දීමනා වලින් සියයට 50 ක් විය යුතු වුවද. එය නොසලකා තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ලබා ගන්නා ලද ප්‍රතිලාභියෙකු, නැවත විවාහ වීමෙන් පසුවද ඇය වෙත ගෙවන ලද වැඩිපුර මුදල් ගණනය කර අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම ඇළහැර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් විශ්‍රාම වැටුප් ලැබූ මියගිය රණවිරුවකුගේ වැන්දඹුව වෙත නැවත විවාහ වීමෙන් පසුවද එනම්, 2019 ජනවාරි 10 දින සිට 2019 සැප්තැම්බර් 30 දක්වා කාලය වෙනුවෙන් රු.237,942 ක වැඩිපුර ගෙවීම් සිදුකර තිබුණි.

(iii) ත්‍රස්තවාදී ක්‍රියා හේතුවෙන් මිය ගිය පොලිස් සැරයන් රියදුරුවරයෙකු වෙත ලබාදෙමින් තිබූ වැටුප් හා දීමනා 2019.08.20 දින සිට නවතා තිබුණද, වැලිකන්ද ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් ඔහුගේ වැන්දඹුවට හිමි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප හිමිගන්වා නොතිබුණි.

3.7.3 අයවිය යුතු මුදල්

(i) ණය ලබාදීමේ අරමුණු, අවශ්‍යතාවය, ණය පියවීමේ හැකියාව හා ව්‍යාපෘති ශක්‍යතාවය වැනි කරුණු පිළිබඳව සැලකිලිමත්ව ණය නිකුත් කිරීමේ කාර්යය සිදුනොකිරීමත්, පසු විපරම් කටයුතු හා ණය නැවත අයකර ගැනීමේදී ප්‍රමාණවත් අවධානයක් හා අභ්‍යන්තර පාලන ක්‍රියාවලියක් ක්‍රියාත්මක කර නොතිබීමත් හේතුවෙන් සමෘද්ධි බැංකු සංගම් 22 ක පුද්ගල ගිණුම් 3,224 ක් මඟින් අයවිය යුතු රු. 93,553,053 ක් වූ ණය මුදල් 2021 ජූනි 30 දිනට බොල් ණය බවට පත්වී තිබුණි.

(ii) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් III ශ්‍රේණියේ අංක 01 දරණ රජයේ නිවාසයේ පදිංචිව සිටි නිලධාරියකුගෙන් රු. 85,857 ක හිඟ නිවාස කුලියක් අයවීමට තිබුණි.

(iii) සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් නැවත ප්‍රතිපූර්ණය කිරීමේ පදනම මත කොරෝනා වසංගතය හේතුවෙන් පීඩාවට පත් සමෘද්ධි ලාභීන් සහ අඩු ආදායම්ලාභී පවුල් සඳහා සහන පියවර සහ සහන අරුණළු දීමනා ගෙවීම සඳහා ප්‍රජා මූල සමෘද්ධි බැංකු සංගම්වල තිබූ අරමුදල් භාවිතා කරමින් ලබාදී තිබුණු රු.185,355,000 ක මුදලින් රු.182,834,000 ක මුදලක් සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රතිපූර්ණය කරගැනීමට කටයුතු කර නොතිබුණි.

3.7.4 ඉඩම් අංශයේ කාර්යසාධනය

(i) ඇළහැර, හිඟුරක්ගොඩ, තමන්කඩුව, මැදිරිගිරිය හා ලංකාපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් මැනීම් කටයුතු සඳහා මිනින්දෝරු දෙපාර්තමේන්තුව වෙත 2013 සිට 2021 දක්වා යොමුකරන ලද මැනුම් ඉල්ලීම් 1,287 ක් අතුරින් රේඛා චිත්‍ර 1,105 ක ප්‍රමාණයක් තවදුරටත් ලැබී නොතිබුණි.

(ii) ඇළහැර හා මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් දීර්ඝ කාලීන බදු පදනම මත බැහැර කර ඇති වාණිජ, කෘෂිකාර්මික හා නේවාසික ඉඩම් සඳහා බදුකරුවන් 30 දෙනෙකු ගෙන් අයවිය යුතු හිඟ බදු ආදායම රු.4,972,596 ක් වී තිබුණි.

(iii) 2016 සිට 2019 දක්වා වූ කාලය තුලදී සංවර්ධන කාර්යයන් සඳහා අත්පත් කර ගන්නා ලද තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් පෞද්ගලික ඉඩම් කැබලි 391 ක් සඳහා 2022 ජනවාරි 11 දින වන විටත් වන්දි මුදල් ගෙවීමට කටයුතු කර නොතිබුණු අතර, 1950 අංක 09 දරණ ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38(අ) අනුරු විධානය ගැසට් පත්‍රයේ පළ කළ දිනයේ සිට වන්දි මුදල් ගෙවන දිනය දක්වා කාලය සඳහා සියයට 7 ක පොලියක්ද සමඟ වන්දි මුදල් ගෙවීමට සිදු වීමෙන්, මෙම ප්‍රමාදය තුල රජයට අනවශ්‍ය වැය බරක් දැරීමට සිදු වීම මෙන්ම, ඉඩම්වල හිමිකරුවන්ට නියමිත ප්‍රතිලාභ ලබා ගැනීමට බොහෝ කාලයක් බලා සිටීමට සිදුවීමද වළක්වා ගත නොහැකි විය.

(iv) ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අනවසරයෙන් ඉඩම් භුක්ති විඳින ඉඩම් කට්ටිකරුවන් විසින් 2019 සිට 2021 දක්වා කාලය තුළ ප්‍රාදේශිය ලේකම් වෙත යොමුකරන ලද අයදුම්පත් 1,352 ක් වෙනුවෙන් ඉඩම් කච්චේරි පවත්වා නොතිබුණි.

(v) 2020 ජනවාරි 13 දිනැති අංක 114/15 දරණ අති විශේෂ ගැසට් පත්‍රය මඟින් ඇළහැර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් භූමි ප්‍රමාණයක් ජාතික අභය භූමියක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන අවස්ථාව වන විටත් පදිංචිකරුවන් විසින් ඉඩම් කට්ටි භුක්ති විඳිමින් සිට ඇති අතර අදාළ ඉඩම් කට්ටිකරුවන් සම්බන්ධයෙන් සුදුස්සක් කිරීමට ප්‍රමාණවත් අවධානයක් යොමුවී නොතිබුණි.

(vi) මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට වර්ෂ 1 – 9 ත් අතර කාලයක් තිස්සේ රු.1,738,988 ක බදු මුදල් ගෙවා තිබුණු, බදුකරුවන් 12 කට අදාළව ඉඩම් කොමසාරිස් වෙත යොමුකර තිබුණු බදුකර මේ දක්වා ලැබී නොතිබුණි.

04. යහපාලනය

4.1 මහජනයා වෙත සේවා ඉටුකිරීම

(i) 2020 සහ 2021 වර්ෂවල සිදු වී ඇති වන අලිහානි 153 ක් වෙනුවෙන් වන්දි ගෙවීම් සිදු කර නොතිබුණි.

(ii) තමන්කඩුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ බහුකාර්යය සංවර්ධන සහයකයින් බඳවාගැනීමේ දෙවන අදියර යටතේ සුදුසුකම් ලැබූ අයදුම්කරුවන් 201ක ගෙන් ලකුණු 29 ත් 50 ත් අතර ඉහළම ලකුණු ලබාගත් අයදුම්කරුවන් 58ක් අතරින් පත්වීම් ලිපි ලබාදී තිබුණේ අයදුම්කරුවන් 15ක් වෙත පමණක් වන අතර, ඉතිරි පත්වීම්ලාභීන් 43 දෙනා ඇගයීම් ලකුණු 6ත් 28ත් අතර ලකුණු ලබාගත් අය බැවින් අභ්‍යාසලාභීන් තෝරා ගැනීමේ ක්‍රියාපටිපාටිය විනිවිදභාවයකින් තොරව සිදුකර තිබුණි.

05. මානව සම්පත් කළමනාකරණය

(i) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සමාලෝචිත වර්ෂය අවසාන වන විට ජ්‍යෙෂ්ඨ මට්ටමේ කාර්ය මණ්ඩල පුරප්පාඩු 11 ක්ද, තෘතියික මට්ටමේ පුරප්පාඩු 14 ක්ද, ද්විතියික හා ප්‍රාථමික මට්ටමේ පුරප්පාඩු 234 ක්ද පැවතුණි. එසේම ද්විතියික මට්ටමේ අතිරික්ත සේවක සංඛ්‍යාව 16 ක් විය.

(ii) පොළොන්නරුව දිස්ත්‍රික් සමෘද්ධි කාර්යාලවල සමෘද්ධි කළමණාකාර තනතුරට අනුමත සේවක සංඛ්‍යාව 54 ක් වුවත්, 2021 දෙසැම්බර් 30 දින වන විට තත්‍ය කළමණාකරුවන් සංඛ්‍යාව 29 ක් වීමෙන් වසර 07 කට අධික කාලයක් තිස්සේ මෙම තනතුරු 25 පුරප්පාඩුව පැවතුණි.

(iii) සමෘද්ධි කළමණාකරුවන් 09 දෙනකු2021 ජුනි 30 දිනට වසර 05 කට වැඩි කාලයක සිට තමන්ගේ ස්ථිර සේවා ස්ථානයට අමතරව වෙනත් බැංකු සංගමයක වැඩ බැලීමේ තනතුරු වල නිරත වී තිබුණි.

(iv) පොළොන්නරුව දිස්ත්‍රික්කයේ සමෘද්ධි කාර්යාලවලට අනුමත සමෘද්ධි සංවර්ධන නිලධාරී සංඛ්‍යාව 476 ක් වුවද, 2021 ජූනි 30 දින වන විට තත්‍ය ලෙස සිටින සේවක සංඛ්‍යාව 410 ක් වීම හේතුවෙන් පුරප්පාඩු සංඛ්‍යාව 66 ක් ව පැවතුණි.

ඩබ්.එම්.ජේ.එම්.නුණුකුඹුර

ජ්‍යෙෂ්ඨ සහකාර විගණකාධිපති,

විගණකාධිපති වෙනුවට.

ඩබ්.එම්.ජේ.එම්. නුණුකුඹුර
සහකාර විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

පිටපත්:- 01. අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මහා භාණ්ඩාගාරය, කොළඹ 02.

02. ලේකම් - රාජ්‍ය ආරක්ෂක, ස්වදේශ කටයුතු හා ආපදා කළමනාකරණ රාජ්‍ය අමාත්‍යාංශය.